67431



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**81 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | | |
|---|---|---|
| **කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය** | **I, II** | **පැය තුනයි** |
| විவசாயமும் உணவுத் தொழினுட்பவியலும் | **I, II** | *மூன்று மணித்தியாலம்* |
| Agriculture and Food Technology | **I, II** | *Three hours* |

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු ආරම්භ කරන ලද ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය වූයේ ගල්ඔය ගංගා නිම්න සංවර්ධන ව්‍යාපාරයයි. මේ යටතේ ඉදිකරන ලද ජලාශය වනුයේ,
   (1) උඩවලව ජලාශය ය.
   (2) සේනානායක සමුද්‍රය ය.
   (3) ලුණුගම්වෙහෙර ජලාශය ය.
   (4) චන්ද්‍රිකා වැව ය.

2. සාර්ථක ගෙවතු වගාවක එක් අරමුණක් වනුයේ එයින් පවුලේ සාමාජිකයින්හට සමබල ආහාර වේලක් සපයා ගැනීමයි. සමබල ආහාර වේලක අඩංගු විය යුතු පෝෂක නම්,
   (1) කාබෝහයිඩ්‍රේට්, පිෂ්ඨය, මේද, විටමින් සහ ඛනිජ ලවණ ය.
   (2) ලිපිඩ, මේද, ප්‍රෝටීන්, කාබෝහයිඩ්‍රේට් සහ ඛනිජ ලවණ ය.
   (3) කාබෝහයිඩ්‍රේට්, ලිපිඩ, ප්‍රෝටීන්, විටමින් සහ ඛනිජ ලවණ ය.
   (4) පිෂ්ඨය, සීනි, ලිපිඩ, මේද සහ ප්‍රෝටීන් ය.

3. පවනේ වියළන ලද පස් සාම්පලයක් මිලිමීටර 0.2 ක සිදුරු සහිත පෙනේරයකින් හලන ලදී. පෙනේරයේ ඇල මතුපිට ඉතිරි වනුයේ,
   (1) සියුම් වැලි හා රොන්මඩ ය.
   (2) රළු වැලි හා සියුම් වැලි ය.
   (3) රොන් මඩ හා මැටි ය.
   (4) බොරළු හා රළු වැලි ය.

4. ශ්‍රී ලංකාවේ ගංගා මිටියාවත්වල ව්‍යාප්ත වී ඇති මහා පස් කාණ්ඩය වනුයේ,
   (1) රතු කහ පොඩ්සොලික් පස ය.
   (2) රතු දුඹුරු පස ය.
   (3) දියළු පස ය.
   (4) අපරිණත දුඹුරු ලෝම පස ය.


5. ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවලට වැඩි ම වර්ෂාපතනයක් ලැබෙනුයේ,
   (1) ඊසානදිග මෝසම් වර්ෂාව මගිනි.
   (2) නිරිතදිග මෝසම් වර්ෂාව මගිනි.
   (3) සංවහන වර්ෂාව මගිනි.
   (4) වාසුළි වර්ෂාව මගිනි.

6. වාර්ෂික වර්ෂාපතනය අනුව ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාප තුනකට වෙන්කර ඇත. එම කලාප තුන වනුයේ,
   (1) තෙත් කලාපය, වියළි කලාපය සහ ශුෂ්ක කලාපයයි.
   (2) තෙත් කලාපය, අතරමැදි කලාපය සහ වියළි කලාපයයි.
   (3) තෙත් කලාපය, වියළි කලාපය සහ අර්ධ ශුෂ්ක කලාපයයි.
   (4) උඩරට තෙත් කලාපය, මැදරට තෙත් කලාපය සහ පහතරට වියළි කලාපයයි.

7. ශාක කුල පදනම් කර ගත් බෝග වර්ගීකරණය කෘෂිකර්මයේ දී වැදගත් වේ. සොලනේසියේ (Solanaceae) කුලයට අයත් බෝග කාණ්ඩය වනුයේ,
   (1) බඩ ඉරිඟු, සෝයා බෝංචි සහ කුරක්කන් ය.
   (2) කව්පි, මුං සහ තක්කාලි ය.
   (3) අර්තාපල්, තක්කාලි සහ මිරිස් ය.
   (4) වට්ටක්කා, පතෝල සහ වම්බටු ය.

[දෙවැනි පිටුව බලන්න.

8. රූපසටහනේ දැක්වෙන ආකාරයට බීජ ප්‍රරෝහණය සිදුවන බෝගය වනුයේ,



(1) වී ය. (2) බඩ ඉරිඟු ය.
(3) කඩල ය. (4) මුං ය.

9. පත්‍ර කැබලි, වැලි තවානක සිටුවීමෙන් මුල් අද්දවා ගත හැකි ශාක වනුයේ,
(1) වද සහ අක්කපාන ය. (2) කෝලියාස් සහ බතල ය.
(3) තේක්ක සහ බිගෝනියා ය. (4) බිගෝනියා සහ අක්කපාන ය.

10. ඒකීය සූර්ය ප්‍රචාරකයක් සම්බන්ධව පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) එයට නිතර ජලය සම්පාදනය කළ යුතු ය.
(2) එහි ජලවහන සිදුරු නොතිබිය යුතු ය.
(3) මෙහි සිටුවන දඬු කැබලිවලට මුල් ඇදීමේ හෝමෝන යෙදීම අත්‍යවශ්‍ය ය.
(4) මෙය සෑදීමට වඩාත් සුදුසු වනුයේ කළු පොලිතින් ය.

11. උඩුකුරු T, යටිකුරු T සහ H වශයෙන් අංකුර බද්ධ ක්‍රම කිහිපයකි. මෙම නම් කිරීමෙහි පදනම වනුයේ,
(1) අනුජය ලෙස යොදා ගන්නා අංකුර සංඛ්‍යාවයි.
(2) අනුජය මත කැපුම් යොදන ආකාරයයි.
(3) ග්‍රාහකය මත කැපුම් යොදන ආකාරයයි.
(4) ග්‍රාහකයට අනුජය සවිකරන ආකාරයයි.

12. රිකිලි බද්ධයක් සිදු කිරීමෙන් පසු එහි අනුජය පොලිතින්වලින් ආවරණය කිරීම සුදුසු ය. මෙහි අරමුණ වනුයේ,
(1) කෘමි හානි වළක්වා ගැනීම ය.
(2) රෝග කාරක ජීවීන් ඇතුල්වීම වළක්වා ගැනීම ය.
(3) අනුජයෙන් ජලය උත්ස්වේදනය වීම අවම කිරීම ය.
(4) අවට සාපේක්ෂ ආර්ද්‍රතාව අඩු කිරීම ය.

13. වර්ධක ප්‍රචාරණය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A - වර්ධක ප්‍රචාරණයෙන් ලබා ගන්නා ශාක මවු ශාකයේ ලක්ෂණවලින් යුක්ත ය.
B - වර්ධක ප්‍රචාරණයෙන් ලබා ගන්නා ශාක කුඩා බැවින් පාලනය කිරීම පහසු ය.
C - වර්ධක ප්‍රචාරණය මගින් දෙමුහුම් දිරිය සහිත බෝග ප්‍රභේද නිපදවාගත හැකි ය.


ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C සියල්ලම ය.

The National e-learning Portal for General Education

14. සෝයා බෝංචි බීජ, ක්ෂේත්‍රයේ සිටුවීමට පෙර ඊට රෛසෝබියම් බැක්ටීරියා එක් කිරීම මගින් ආමුකුලනයට ලක් කරනු ලැබේ. මෙහි අරමුණ වනුයේ,
(1) බීජාවරණය තුනී කර ප්‍රරෝහණය පහසු කිරීම ය.
(2) බීජවල ඇති නිශේධක ද්‍රව්‍ය ඉවත් කිරීම ය.
(3) බැක්ටීරියා අසාදන වැළැක්වීම ය.
(4) නයිට්‍රජන් තිර කිරීමට උපකාර වීම ය.

15. වී වගාවක තැනින් තැන ශාක කහ පැහැ ගැන්වී, වියළී, පිළිස්සී ගිය වෘත්තාකාර ප්‍රදේශ දක්නට ලැබුණි. මෙයට හේතු විය හැකි පළිබෝධකයා,
(1) ගොයම් මකුණා ය. (2) දුඹුරු පැළ කීඩෑවා ය.
(3) කුඩිත්තා ය. (4) පැළ මැක්කා ය.

16. පහත රූපසටහනෙහි දැක්වෙන්නේ අසම්පූර්ණ රෝග ත්‍රිකෝණයකි.




මෙහි A අක්ෂරය මගින් පෙන්නුම් කරනුයේ,
(1) ධාරකයා ය. (2) වාහකයා ය. (3) උෂ්ණත්වය ය. (4) සාපේක්ෂ ආර්ද්‍රතාවය ය.

17. ආගන්තුක ආක්‍රමණශීලී ශාක පමණක් ඇතුළත් වල් පැළෑටි කාණ්ඩය මින් කුමක් ද?
(1) කළාඳුරු, තුනැස්ස හා විඩේලියා
(2) මොනරකුඩුම්බිය, බැලතණ හා ගඳපාන
(3) පාතිනියම්, යෝධ නිදිකුම්බා හා සැල්වීනියා
(4) බටදැල්ල, හුළංතලා හා ගිරාපලා

18. පහත *A* හා *B* ක්‍රියාවලි නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරෙහි ද?

පාෂාණ —*A*→ මාතෘ ද්‍රව්‍ය —*B*→ පස

(1) *A* - භෞතික ජීර්ණය, *B* - රසායනික ජීර්ණය
(2) *A* - රසායනික ජීර්ණය, *B* - භෞතික ජීර්ණය
(3) *A* - පාෂාණ ජීර්ණය, *B* - පාංශු ජනනය
(4) *A* - පාංශු ජනනය, *B* - පාෂාණ ජීර්ණය

19. ජලයේ ඉතා හොඳින් දිය වන, සුදු පැහැති, ගෝලාකාර කැට වශයෙන් පවතින රසායනික පොහොර වර්ගයක් වනුයේ,
(1) ඇමෝනියම් සල්ෆේට් ය.
(2) ත්‍රිත්ව සුපර් පොස්ෆේට් ය.
(3) යූරියා ය.
(4) මියුරියේට් ඔෆ් පොටෑෂ් ය.

20.

| | ගව වර්ග | එළු වර්ග | ඌරු වර්ග |
|---|---|---|---|
| *A* | ලෙග්හෝන් | බෝයර් | ලාජ් වයිට් |
| *B* | සින්දි | සානන් | නිලිරවි |
| *C* | තර්පකාර් | කොට්ටුකච්චි | සූර්ති |
| *D* | සහිවාල් | ජම්නපාරි | ලෑන්ඩ් රේස් |

ඉහත වගුවෙහි සත්ත්ව වර්ග සියල්ල නිවැරදි ව සඳහන්ව ඇති පේළිය වනුයේ,
(1) *A* ය. (2) *B* ය. (3) *C* ය. (4) *D* ය.

21. පහත සඳහන් ද්‍රව්‍ය අතරින් නිර්පාංශු වගාවේ පෝෂණ මාධ්‍යය ලෙස භාවිත කිරීමට වඩාත් සුදුසු වනුයේ,
(1) ඇල්බට් ද්‍රාවණයයි.
(2) ඒගාර් මාධ්‍යයයි.
(3) ගැඩවිලි පොහොර මිශ්‍රණයයි.
(4) බෝඩෝ මිශ්‍රණයයි.

22. භූමියක වගා කර ඇති ප්‍රධාන බෝගය අතර එම බෝගයට තරගයක් ඇති නොවන පරිදි වෙනත් බෝග ක්‍රමවත්ව වගා කිරීම,
(1) අතුරු බෝග වගාව නම් වේ.
(2) මිශ්‍ර බෝග වගාව නම් වේ.
(3) ඒක බෝග වගාව නම් වේ.
(4) කඩින් කඩ බෝග වගාව නම් වේ.

23. පහත සඳහන් ශාක පෝෂක අතරින් මහා පෝෂකයක් වනුයේ,
(1) කාබන් ය. (2) යකඩ ය. (3) සින්ක් ය. (4) මොලිබ්ඩිනම් ය.

24. බිම් සකස් කිරීමේ උපකරණ සම්බන්ධව ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A - සැහැල්ලු යකඩ නඟුල සහ ඇණදත් පෝරුව සත්ත්ව බලයෙන් ක්‍රියා කරවන උපකරණ වේ.
B - තැටි නඟුල හා හැඩලැලි නඟුල යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරවන උපකරණ වේ.
C - උදැල්ල හා රොටරි විඩරය අතුරුයත් ගෑමේ දී භාවිත කරන උපකරණ වේ.
මේවායින් නිවැරදි ප්‍රකාශ වනුයේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C සියල්ලම ය.

25. ඩැපොග් තවානක වගා කර ඇති ගොයම් පැළ ක්ෂේත්‍රයේ සිටුවීමට යෝග්‍ය වන්නේ තවාන් දමා,
(1) දින 7 - 10 අතරේ දී ය.
(2) දින 10 - 14 අතරේ දී ය.
(3) දින 14 - 17 අතරේ දී ය.
(4) දින 17 - 21 අතරේ දී ය.

26. කුකුළන්ට වැළඳෙන කොක්සිඩියෝසිස් රෝගයේ රෝග කාරකයා,
(1) ප්‍රෝටොසෝවාවෙකි. (2) බැක්ටීරියාවකි. (3) දිලීරයකි. (4) වෛරසයකි.

27. කුකුළු පැටවුන් බෲඩරයක් තුළ රැක බලා ගැනීමේ ප්‍රධාන අරමුණ වනුයේ,
(1) රෝග වැළඳීම වළක්වා ගැනීම ය.
(2) විලෝපිකයන්ගෙන් පැටවුන් ආරක්ෂා කර ගැනීම ය.
(3) පරිසර උෂ්ණත්වයට හුරුවන තෙක් පැටවුන් රැක බලා ගැනීම ය.
(4) නුසුදුසු පැටවුන් ඉවත් කිරීම පහසු කර ගැනීම ය.

28. ශාකවල නයිට්‍රජන් ඌනතාවයක දී දැකිය හැකි ලක්ෂණයක් වනුයේ පහත සඳහන් කවරක් ද?
(1) පත්‍ර දාර පිළිස්සුණු ස්වභාවයක් ගැනීම
(2) මේරූ පත්‍ර කහ පාට වීම
(3) පුෂ්ප ඇති වීම ප්‍රමාද වීම
(4) පත්‍ර නාරටි අතර පමණක් කහ පාට වීම

[හතරවැනි පිටුව බලන්න.

29. දවල් කාලයේ එළිමහනේ දිගෙලි කර උලාකෑමට ඉඩ හැර, රාත්‍රි කාලයේ ගාලක ලැගීමට සලස්වා ගවයන් ඇති කිරීමේ ක්‍රමය හඳුන්වන්නේ,
(1) නිදැලි ක්‍රමය ලෙස ය.
(2) අඩ සියුම් ක්‍රමය ලෙස ය.
(3) සියුම් ක්‍රමය ලෙස ය.
(4) හිසට හිස ක්‍රමය ලෙස ය.

30. ගවයින්ගේ කෘත්‍රිම සිංචනය පිළිබඳ ව ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A - කෘත්‍රිම සිංචනයේ දී ලිංගාශ්‍රිත රෝග බෝවීමේ අවදානම අඩු ය.
B - එක් පුං ගවයකුගේ ශුක්‍රාණුවලින් දෙනුන් විශාල සංඛ්‍යාවක් සිංචනය කළ හැකි ය.
C - කෘත්‍රිම සිංචනය මගින් වැඩිපුර පිරිමි සතුන් බිහි වේ.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C සියල්ලම ය.

31. සියලු ම පළිබෝධ පාලන ක්‍රම අවස්ථානුකූලව මනා ලෙස සංකලනය කරමින් කෘෂි රසායනික ද්‍රව්‍ය අවම ලෙස යොදා ගෙන සිදු කරනු ලබන පළිබෝධ පාලන ක්‍රමය,
(1) කෘෂිකාර්මික ක්‍රමයයි. (2) යාන්ත්‍රික ක්‍රමයයි. (3) ඒකාබද්ධ ක්‍රමයයි. (4) රසායනික ක්‍රමයයි.

32. ක්ෂුද්‍ර ජීවීන් මගින් කිරි පැසවීමට භාජනය කිරීමෙන් නිපදවා ගත හැකි ආහාරයකි,
(1) වියළි කිරිපිටි. (2) යෝගට්. (3) කල්කිරි. (4) පැස්චරීකෘත කිරි.

33. ස්වභාවික හා කෘත්‍රිම පරිරක්ෂක යොදා සකස් කළ මස් නිෂ්පාදනයකි,
(1) සෝයා මීට්. (2) හැම්. (3) සොසේජ්. (4) බේකන්.

34. කුකුළු ආහාර සලාකයකට ඇතුළත් කළ හැකි ප්‍රෝටීන ආහාරයක් වනුයේ,
(1) තිරිඟු පිටි ය. (2) බඩ ඉරිඟු ය. (3) මාළු කුඩු ය. (4) සිප්පි කටු ය.

35. කුකුළු පාලනයේ දී බ්‍රොයිලර් අවසාන සලාකය (broiler finisher ration) සැපයිය යුතු වන්නේ,
(1) දින 1 - 28 අතර වයසේ දී ය.
(2) දින 1 - 42 අතර වයසේ දී ය.
(3) දින 29 - 42 අතර වයසේ දී ය.
(4) දින 10 - 42 අතර වයසේ දී ය.

36. ගව දෙනකගේ සම්මත වියළි කාලය,
(1) මාස 2 කි. (2) මාස 4 කි. (3) මාස 8 කි. (4) මාස 9 කි.

37. පහසුවෙන් ජීර්ණය නොවන දළ ආහාර මගින් ගවයින් පෝෂණය කළ හැකි වනුයේ,
(1) ඔවුන් දළ අහාර ප්‍රිය කරන නිසා ය.
(2) ඔවුන්ට සංයුක්ත ආමාශයක් පිහිටා ඇති නිසා ය.
(3) ඔවුන්ට සරල ආමාශයක් පිහිටා ඇති නිසා ය.
(4) දළ ආහාර සොයා ගැනීම පහසු වන නිසා ය.

38. භාණ්ඩ හා සේවා නිපැයුම සඳහා යොදා ගන්නා නිෂ්පාදන සාධක හතරකි. ඒවා නම්,
(1) භූමිය, ජලය, පස සහ දේශගුණයයි.
(2) භූමිය, උපකරණ, ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වයයි.
(3) ප්‍රාග්ධනය, ශ්‍රමය, භූමිය සහ යහපත් දේශගුණයයි.
(4) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වයයි.

39. කෘෂිකර්මයේ දී මූලික බිම් සකස් කිරීම සඳහා භාවිත කරන තැටි නඟුල මගින් සිදු කරනු ලබන්නේ,
(1) පස කැපීමයි.
(2) පස කැපීම හා පෙරළීමයි.
(3) පස කැපීම, පෙරළීම හා කැට පොඩි කිරීමයි.
(4) පස කැපීම, පෙරළීම, කැට පොඩි කිරීම හා මට්ටම් කිරීමයි.

40. උස් පාත්ති, ගිල් වූ පාත්ති, වැටි හා කාණු පාත්ති සහ තනි වගා වළවල් වශයෙන් පාත්ති වර්ග හතරකි. පහත සඳහන් බෝග කාණ්ඩ අතරින් වැටි හා කාණු පාත්තිවල වගා කිරීමට නිර්දේශ කරනු ලබන්නේ,
(1) බටු, බණ්ඩක්කා හා මිරිස් ය.
(2) තක්කාලි, වැටකොළු හා දඹල ය.
(3) කරවිල, බෝංචි හා මෑ ය.
(4) බතල, අර්තාපල් හා රටකජු ය.

**

[පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I, II
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் I, II
Agriculture and Food Technology I, II

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II

* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

**1.** බෝග වගාවේ දී උපරිම අස්වැන්නක් ලබා ගැනීම සඳහා බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා ඇති සියලු කටයුතු මැනවින් කළමනාකරණය කළ යුතු අතර නිරෝගී, ශක්තිමත් පැළ ලබා ගැනීම සඳහා තවාන් පාලනය ද ඉතා වැදගත් වේ.

(i) (a) එළවළු පැළ ලබා ගැනීම සඳහා සකස් කළ යුතු තවාන් පාත්තියක සම්මත පළල කොපමණ ද?
(b) එම සම්මත පළල යොදා ගැනීමට හේතුව සඳහන් කරන්න.

(ii) (a) යල කන්නයේ දී වියළි කලාපයට සුදුසු තවාන් පාත්ති වර්ගය කුමක් ද?
(b) එම තවාන් පාත්ති වර්ගය සුදුසු වීමට හේතුව සඳහන් කරන්න.

(iii) තවාන් පාත්ති ජීවානුහරණය කළ හැකි ක්‍රමයක් නම් කර එය කෙටියෙන් විස්තර කරන්න.

(iv) තවාන් නොදමා කෙලින්ම ක්ෂේත්‍රයේ බීජ සිටුවන බෝග **හතරක්** නම් කරන්න.

(v) එළවළු වගාවකට රෝග වැළඳීම වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **හතරක් සඳහන් කරන්න.**

(vi) පලතුරු මැස්සා පාලනයට යොදා ගන්නා පෙරමෝන උගුලක රූපසටහනක් ඇඳ **කොටස් නම් කරන්න.**

(vii) බෝග වගාවක් සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය **යුතු කරුණු හතරක්** සඳහන් කරන්න.

(viii) කෘෂිකර්මයේ දී දුර්වල ජලවහනය නිසා ඇති විය හැකි අහිතකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න

(ix) (a) වල් පැළෑටියක් යනු කුමක් දැයි අර්ථ දක්වන්න.
(b) වල් පැළෑටි පාලනය සඳහා රසායනික ක්‍රම යොදා ගැනීමෙන් ඇති විය හැකි **අහිතකර බලපෑම් දෙකක්** ලියන්න.

(x) (a) පසක් ආම්ලික වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.
(b) පාංශු ආම්ලිකතාව ඉවත් කර ගැනීමට යොදා ගත හැකි ද්‍රව්‍යයක් ලියන්න.

**2.** කෘෂිකර්මාන්තයේ දී පසෙහි සංඝටක කෙරෙහි මෙන් ම පාංශු ලක්ෂණ කෙරෙහි ද අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

(i) (a) පාංශු ව්‍යුහය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
(b) පාංශු ව්‍යුහ ආකාර **දෙකක්** නම් කර ඒවායේ රූපසටහන් අඳින්න.

(ii) (a) බෝග වගාවට පාංශු වාතය වැදගත් වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.
(b) පසක පාංශු වාතනය දියුණු කළ හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(iii) පසක පවතින පාංශු ජල ආකාර **තුන** නම් කර ඉන් **එකක්** විස්තර කරන්න.

**3.** බෝග වගාවේ දී පෝෂණ ඌනතා මගහරවා ගැනීම සඳහා පොහොර යෙදීමට සිදු වේ.


(i) (a) බෝගවල පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූල ද්‍රව්‍ය **හතරක්** නම් කරන්න.
(b) පොටෑසියම් හිඟ වීම නිසා ශාකවල දක්නට ලැබෙන ඌනතා ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ii) (a) බෝගවලට පොටෑසියම් ලබාදීම සඳහා යොදන රසායනික පොහොර වර්ගයක් නම් කරන්න.
(b) බෝගවලට රසායනික පොහොර යෙදීමෙන් සිදු විය හැකි අයහපත් ප්‍රතිඵල **දෙකක්** ලියන්න.

(iii) (a) කෘෂිකර්මයේ දී භාවිතවන කාබනික පොහොර වර්ග **හතරක්** සඳහන් කරන්න.
(b) බෝගවලට කාබනික පොහොර යෙදීමෙන් අත්වන වාසි **හතරක්** ලියන්න.

[හයවැනි පිටුව බලන්න.

**4.** මෙහි දැක්වෙන්නේ වර්ධක ප්‍රචාරණ ක්‍රමයක රූපසටහනකි.




(i) (a) එම වර්ධක ප්‍රචාරණ ක්‍රමය නම් කරන්න.
(b) මෙහි *A* ලෙස යොදා ගැනීමට සුදුසු ද්‍රව්‍යයක් නම් කරන්න.
(c) මෙහි *B* ලෙස යොදා ගැනීමට සුදුසු ද්‍රව්‍යයක් නම් කරන්න.

(ii) (a) රූපසටහනේ *C* ස්ථානයේ දී අත්තට සිදුකර ඇත්තේ කුමක් ද?
(b) එසේ කිරීමේ අරමුණ පැහැදිලි කරන්න.

(iii) සමහර ශාක වර්ග භූගත කඳන් මගින් ප්‍රචාරණය වෙයි.
(a) භූගත කඳන් වර්ග **හතරක්** නම් කර එම කඳන් වර්ග භාවිතයෙන් ප්‍රචාරණය කරනු ලබන බෝගය බැගින් සඳහන් කරන්න.
(b) භූගත කඳන් සහිත වල් පැළෑටි සාර්ථක ව මර්දනය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රම **දෙකක්** ලියන්න.

**5.** කෘෂිකර්මයේ දී අපේක්ෂිත අස්වැන්න ලබා ගැනීමට කෘමි පළිබෝධ ජීවන චක්‍ර, ඔවුන්ගෙන් බෝගවලට සිදු වන හානි සහ එම හානි පාලනය කරගත හැකි ක්‍රම පිළිබඳ ව අවබෝධයක් තිබීම ඉතා වැදගත් වේ.

(i) (a) පූර්ණ රූපාන්තරණය සහිත කෘමීන්ගේ ජීවන චක්‍රයේ අවස්ථා සඳහන් කරන්න.
(b) පූර්ණ රූපාන්තරණය පෙන්වන කෘමි පළිබෝධකයින් **දෙදෙනකු** නම් කරන්න.
(c) අර්ධ රූපාන්තරණය පෙන්වන කෘමි පළිබෝධකයින් **දෙදෙනකු** නම් කර ඔවුන් හානි කරන බෝගය බැගින් වෙන වෙනම ලියන්න.

(ii) (a) බෝගවලට වෛරස් රෝග බෝකරන කෘමි පළිබෝධකයින් **දෙදෙනකු** නම් කරන්න.
(b) බෝගවලට වෛරස් රෝග වැළඳුනු විට පෙන්නුම් කරන පොදු රෝග ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(iii) (a) වී වගාවට ගොයම් මකුණාගෙන් (paddy bug) සිදු වන හානිය කුමක් ද?
(b) මෙම හානිය වැළැක්වීම සඳහා සුදුසු පාලන ක්‍රම **දෙකක්** යෝජනා කරන්න.
(c) ගොයම් මකුණා හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයක් සඳහන් කරන්න.

**6.** සත්ත්ව පාලනයේ දී නිවැරදි පාලන ක්‍රම අනුගමනය කිරීමෙන් උසස් ගුණාත්මක සත්ත්ව නිෂ්පාදන ලබා ගත හැකි වේ.

(i) (a) උඩරට තෙත් කලාපයේ ඇති කිරීමට සුදුසු, වැඩි කිරි නිෂ්පාදනයක් ලබා දෙන එළ ගව වර්ග **තුනක්** නම් කරන්න.
(b) එම එක් එක් ගව වර්ගය හඳුනාගත හැකි බාහිර ලක්ෂණයක් බැගින් දක්වන්න.

(ii) (a) පිරිසිදු කිරි නිෂ්පාදනයේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් **හතර** සඳහන් කරන්න.
(b) කිරි දෙවීමේ දී නිසි පිළිවෙත් අනුගමනය නොකිරීම නිසා ගව දෙනුන්ට වැළඳිය හැකි රෝගයක් නම් කර එම රෝගයේ රෝග කාරකයා සඳහන් කරන්න.

(iii) (a) පිරිසිදු බිත්තර නිෂ්පාදනය කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් **තුනක්** සඳහන් කරන්න.
(b) කුකුළු පාලනයේ දී යොදා ගන්නා අතුරණුවක තිබිය යුතු ලක්ෂණ **තුනක්** ලියන්න.

**7.** අතිරික්ත කෘෂි නිෂ්පාදන කල් තබා ගැනීම සඳහා ඒවා පරිරක්ෂණය කරනු ලැබේ. එමගින් ආහාර නරක් වීමෙන් සිදුවන නාස්තිය අඩු කර ගත හැකි ය.

(i) (a) නරක් වූ ආහාර හඳුනාගත හැකි ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
(b) නරක් වූ ආහාර අනුභවය නිසා ඇති විය හැකි ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(ii) ආහාර පරිරක්ෂණ මූල ධර්ම **හතරක්** සඳහන් කර ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) (a) පරිරක්ෂිත ආහාර සඳහා යොදා ගන්නා ඇසුරුම් ද්‍රව්‍යවල තිබිය යුතු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(b) ආහාර ඇසුරුම්කරණයට යොදා ගන්නා කෘත්‍රිම ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

* * *